(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 40]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 නොවැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0109/'08

1\.

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර සහ පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට රටෙහි සමස්ත සහල් පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිපදවනු ලබන ප්‍රමාණය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 20 පුරා පැවති සහල්වල සිල්ලර මිල ගණන් කවරේද;

(iv) පාරිභෝගිකයාට දැරීමට සිදු වී ඇති බර අඩු කිරීමට කිසියම් සහනාධාරයක් දෙනු ලබන්නේද;

(v) එසේ සහනාධාරයක් දෙනු ලබන්නේ නම්, දැනට ලබා දී ඇති සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සහල් ආනයනය කරනු ලබන හෝ දේශීය වශයෙන් නිපදවනු ලබන අවස්ථාවේ සිට පාරිභෝගිකයා වෙත එම සහල් ළඟා වන අවස්ථාව දක්වා දැනට සහල් මත පනවනු ලබන සියලු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0110/'08

2\.

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර සහ පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට රටෙහි සමස්ත පරිප්පු පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිපදවනු ලබන ප්‍රමාණය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 20 පුරා පැවති පරිප්පුවල සිල්ලර මිල ගණන් කවරේද;

(iv) පාරිභෝගිකයාට දැරීමට සිදු වී ඇති බර අඩු කිරීමට කිසියම් සහනාධාරයක් දෙනු ලබන්නේද;

(v) එසේ සහනාධාරයක් දෙනු ලබන්නේ නම්, දැනට ලබා දී ඇති සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පරිප්පු ආනයනය කරනු ලබන හෝ දේශීය වශයෙන් නිපදවනු ලබන අවස්ථාවේ සිට පාරිභෝගිකයා වෙත එම පරිප්පු ළඟා වන අවස්ථාව දක්වා දැනට පරිප්පු මත පනවනු ලබන සියලු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0111/'08

3\.

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර සහ පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට රටෙහි සමස්ත සීනි පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිපදවනු ලබන ප්‍රමාණය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 20 පුරා පැවති සීනිවල සිල්ලර මිල ගණන් කවරේද;

(iv) පාරිභෝගිකයාට දැරීමට සිදු වී ඇති බර අඩු කිරීමට කිසියම් සහනාධාරයක් දෙනු ලබන්නේද;

(v) එසේ සහනාධාරයක් දෙනු ලබන්නේ නම්, දැනට ලබා දී ඇති සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සීනි ආනයනය කරනු ලබන හෝ දේශීය වශයෙන් නිපදවනු ලබන අවස්ථාවේ සිට පාරිභෝගිකයා වෙත එම සීනි ළඟා වන අවස්ථාව දක්වා දැනට සීනි මත පනවනු ලබන සියලු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0228/'08

4\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පරිසර හා ස්වභාවික සම්පත් (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0229/'08

5.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පශු සම්පත් සංවර්ධන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0230/'08

6.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0570/'08

7\. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන විධායක මට්ටමේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු කවරේද;

(iii) හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන විධායක මට්ටමේ නොවන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන අනෙකුත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ සේවා කටයුතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0571/'08

8\. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීතාවකපුර නගර සභා කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන විධායක මට්ටමේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු කවරේද;

(iii) සීතාවකපුර නගර සභා කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන විධායක මට්ටමේ නොවන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීතාවකපුර නගර සභා කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන අනෙකුත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ සේවා කටයුතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0572/'08

9.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීතාවකපුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන විධායක මට්ටමේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු කවරේද;

(iii) සීතාවකපුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන විධායක මට්ටමේ නොවන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීතාවකපුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන අනෙකුත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ සේවා කටයුතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0594/'08

10.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 අයවැය ලේඛණයෙන් පොරොන්දු වූ පරිදි උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ අනුව මේ වනවිට (2007 වර්ෂය තුළ සහ 2008 වර්ෂය තුළ මේ දක්වා) ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර ක්ෂේත්‍රවල, කවර සංඛ්‍යාවක්ද;

(iii) රැකියා ලබා නොදුන් උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට කඩිනමින් රැකියා ලබාදීමට ආරම්භකර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0620/'08

11.

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0621/'08

12\.

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර පුත්තලම දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0751/'08

13\.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, නාගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) නාගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0753/'08

14.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, බෝපේ-පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) බෝපේ-පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0754/'08

15.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, අක්මීමණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ගාල්ල, අක්මීමණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

**යෝජනා පිළිබඳ දැනුම් දීම**

1.

ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"සමස්ථ ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2009) - (පස්වැනි වෙන්කළ දිනය)— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (නොවැම්බර් 06) [1]

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධූරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධූරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධූරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය අනුව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිගේ හා උප සභාපතිගේ වැටුප් 2006.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

උප සභාපති

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 50,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 12.000.00 | මාසික |
| | එකතුව | රු. 62,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුප් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, 2006 වර්ෂයේ සිට මේ දක්වා කොමිෂන් සභාවේ උපසභාපති තනතුරේ සේවය කර ඇති මහාචාර්ය ලාල් පෙරේරා මහතාට සහ දැනට එම තනතුර දරන ආචාර්ය ජී.ඩී. ගුණවර්ධන මහතාට ද මෙම වැටුප් වැඩිවීම අදාළ විය යුතු යැයිද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට හා උප සභාපතිට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 “ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම” දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000<br>රු. 3,900,000,000 | සිට<br>දක්වා |

(iv) එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව රු. 400,000,000 සිට රු. 550,000,000 දක්වා

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*13.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*14.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*15.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*17.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*20.
ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.
ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*23.
අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*24.
ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*25.
ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*26.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*27.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*28.
සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*29.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

30.
දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.
උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

32.
ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---